# බෞද්ධ ආරාම ආශ්‍රිත ව දක්නට ලැබෙන වැසිකිලි කැසිකිලි පද්ධතිය

ජී. එස්. දේශාන්

පුරාවිද්‍යා අධ්‍යයන අංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
deshangs92@gmail.com

---

ආරාමික වාස්තු විද්‍යාත්මක නිර්මාණ අතර දක්නට ලැබෙන ද්විතීයික වාස්තුවිද්‍යා අංගයක් ලෙස වැසිකිලි කැසිකිලි පද්ධතිය දැක්විය හැකිය. මුල් බුදුසමයේදී භික්ෂු සමාජය උදෙසා වැසිකිලි භාවිතය හඳුන්වාදීමට සහ ව්‍යාප්ත කිරීමට බුදුන්වහන්සේ ගනු ලබන උත්සාහය චුල්ලවග්ග පාළියේ සේනායනඛන්දකය වත්තඃඛන්දකය වැනි මූලාශ්‍රවලින් හඳුනාගත හැකිය. තව ද එහි ආරාම තුළ වැසිකිලි කැසිකිලි පද්ධතිය සැකසිය යුතු ආකාරය විස්තර කෙරේ. මෙරට ආරාමික වාස්තුවිද්‍යා නිර්මාණ පද්ධතිය තුළ දක්නට ලැබෙන වැසිකිලි-කැසිකිලි උක්ත මූලික හඳුන්වාදීම්වලට කෙතරම් සමානවන්නේ ද හා පසුකාලීන සංකල්පවලට කෙතරම් දුරට සමගාමීවන්නේ ද යන්න මෙහිදී විමසා බැලේ. මේ දක්වා සිදුකර ඇති අධ්‍යයන අනුව මුල්කාලීන න්‍යායන් හි භාවිතයන් ආරාමික වැසිකිලි-කැසිකිලි අතර හඳුනාගැනීම දැකගත හැකි අතර පසුකාලීන සංකල්පවලට අනුව වෙනස්වීම් ද පෙන්නුම් කෙරේ. උදාහරණයක් ලෙස වැසිකිලි-කැසිකිලි සම්ප්‍රදායන්ට අලංකරණ සම්ප්‍රදායන් එක් වීම දක්නට ලැබේ. එමෙන් ම වැසිකිලි-කැසිකිලි පද්ධතිය පරිසර හිතකාමීත්වය තාක්ෂණය වැනි කරුණු ද විමර්ශනය කිරීමට මෙම අධ්‍යයනය මගින් අපේක්ෂා කෙරේ.

ප්‍රමුඛ පද : වැසිකිලි කැසිකිලි, බෞද්ධාරාම, සේනාසන ඛන්ධකය